# ගිණුම්කරණය

## 12 ශ්‍රේණිය

## 1.1 ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව



e-තක්සලාව
The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa

# ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව

## නිපුනතා මට්ටම් 1.1 - ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු වැදගත් වන ආකාරය විග්‍රහ කරයි.

### ව්‍යාපාර ඒකකය ( Business Entity )

මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා කටයුතු කරන ඕනෑම ආර්ථික ඒකකයක් ව්‍යාපාර ඒකකයක් ලෙස හැඳින්වේ.

මේ අනුව සෑම ව්‍යාපාර ඒකකයක්ම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හෝ අලෙවිකරණය ආදිය හෝ ඒවාට අදාළ විවිධ උපකාරක සේවා ඉටු කිරීම ආදිය සිදු කරනු ලැබේ.

### ගිණුම්කරණ ඒකකය (Accounting Entity)

ගිණුම්කරණ කටයුතු සිදු කිරීම සඳහා පදනම් කර ගනු ලබන යම් නිශ්චිත පුද්ගලයෙක් , ව්‍යාපාර ආයතනයක් , සමාජ සංවිධානයක් , රාජ්‍ය ආයතනයක් , රටක් , ගිණුම්කරණ ඒකකයක් ලෙස හැඳින්වේ.

ඒ අනුව ගිණුම්කරණ කටයුතු කිරීම සඳහා තෝරා ගනු ලබන ගිණුම්කරණ ඒකකයේ ස්වභාවය අනුව ගිණුම්කරණ ඒකකයන් පහත පරිදි වර්ග කළ හැකිය.

**01. පුද්ගල ගිණුම්කරණය - (Personal Accounting)**

යම් කිසි පුද්ගලයෙකු වෙනුවෙන් ගිණුම්කරණ කටයුතු සිදු කිරීම පුද්ගල ගිණුම්කරණය ලෙස හැඳින්වේ.

උදා :- සනත් ජයසූරිය මහතා වෙනුවෙන් සිදු කරන ගිණුම් තැබීමේ කටයුතු

**02. ව්‍යාපාර ගිණුම්කරණය - (Business Accounting)**

ලාභ ලැබීමේ පරමාර්ථයෙන් කටයුතු කරනු ලබන පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතන වෙනුවෙන් සිදු කරනු ලබන ගිණුම් තැබීමේ කටයුතු ව්‍යාපාර ගිණුම්කරණය යන්නෙන් අදහස් වේ.

උදා :- සී/ස නවලෝක සමාගමේ ගිණුම්කරණ

**03. සමාජයීය ගිණුම්කරණය - (Social Accounting)**

ලාභ ලැබීමේ පරමාර්ථයෙන් තොරව එනම් සමාජ සුභසාධන පරමාර්ථයෙන් කටයුතු කරන ක්‍රීඩා සමිති, මරණාධාර සමිති වැනි සමිති ව්‍යාපාර වෙනුවෙන් සිදු කරනු ලබන ගිණුම්කරණය සමාජයීය ගිණුම්කරණයයි.

උදා :- රන්තරු ක්‍රීඩා සමාජය වෙනුවෙන් ගිණුම් තැබීම.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

04. රාජ්‍ය ගිණුම්කරණය - (Government Accounting)

රාජ්‍ය අංශයට අයත් යම්කිසි ආයතනයකට අදාළව සිදු කරනු ලබන ගිණුම් තැබීමේ කටයුතු රාජ්‍ය ගිණුම්කරණය ලෙස හැදින්වේ.

උදා :- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සිදු කරන ගිණුම් තැබීම

05. ජාතික ගිණුම්කරණය - (National Accounting)

යම්කිසි රටකට නැතිනම් යම්කිසි රාජ්‍යයකට අදාළව සිදු කරනු ලබන ගිණුම් තැබීමේ කටයුතු ජාතික ගිණුම්කරණය ලෙස හැදින්වේ.

උදා :- දළ දේශිය නිෂ්පාදිතය ගණනය කිරීම.

## ගිණුම්කරණය නිර්වචනය කිරීම

## (Definition of Accounting)

ව්‍යාපාරය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අවශ්‍ය තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ ඒකකයකට අදාළ ආර්ථිකමය තොරතුරු සැපයීමේ සමස්ත ක්‍රියාවලිය ගිණුම්කරණය ලෙස හැදින්වේ.

❋ ගිණුම්කරණය පිළිබඳව පහත සඳහන් ආයතනයන්ද විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත.

- **ඇමරිකානු පොදු සහතික ලත් ගණකාධිකාරී සංගමය**

**(American Institute of Certified Public Accounting Association)**

" යටත් පිරිසෙයින් අර්ධ වශයෙන්වත් මුල්‍යමය ස්වරූපයක් ගන්නා ගනුදෙනු හා සිද්ධි සුවිශේෂී ආකාරයට මුදල් මාධ්‍ය උපයෝගී කරගෙන සටහන් කිරීමේ , වර්ග කිරීමේ , සාරාංශ කිරීමේ, සහ ඒ ක්‍රියාවලියේ ප්‍රතිඵල විවරණය කිරීමේ කලාව ගිණුම්කරණයයි "

- **ඇමරිකානු ගිණුම්කරණ සංගමය (American Accounting Association)**

තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශ්වයන්ට විනිශ්වය කිරීමටත්, තීරණ ගැනීමටත් හැකි වන අයුරින් ආර්ථික තොරතුරු හඳුනා ගැනීමේත්, මැනීමේත්, සන්නිවේදනය කිරීමේත් ක්‍රියාවලිය ගිණුම්කරණය වේ.

## ගිණුම්කරණයේ අරමුණ

" ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අවශ්‍ය තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික තොරතුරු සන්නිවේදනය කිරීම" ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වේ.

**මීට අමතරව ,**

- ආර්ථික සම්පත් මනා ලෙස හැසිරවීම හා පාලනය
- ආර්ථික ක්‍රියාවලියේ ප්‍රතිඵල ඇගයීම
- නීතිමය අවශ්‍යතා සපුරාලීම


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- සමාජීය අවශ්‍යතාවන් සපුරාලීම යන කරුණු ද ගිණුම්කරණයේ අරමුණු වේ.

## තොරතුරු (විඥාපන) – Information

**දැනුම වර්ධනය කරගැනීමට හා තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන ඕනෑම කරුණක් තොරතුරක් ලෙස හැඳින්වේ.**

ව්‍යාපාරයක් පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වන අයිතිකරුවන්, කළමණාකරුවන්, ණයහිමියන් සහ රජයට ව්‍යාපාරය පිළිබඳ විවිධ තීරණ ගැනීම සඳහා ව්‍යාපාරයට අදාළ විවිධ මූල්‍යමය තොරතුරු අවශ්‍ය වන අතර, එම තොරතුරු ලබා දෙන්නේ ගිණුම්කරණය මඟිනි.

### තොරතුරු වර්ගීකරණය

- තොරතුරු
  - ප්‍රමාණාත්මක තොරතුරු
    - මූල්‍යමය තොරතුරු
      - මූල්‍ය ගිණුම්කරණ තොරතුරු
      - කළමනාකරණ ගිණුම්කරණ තොරතුරු
    - මූල්‍යමය නොවන තොරතුරු
  - ප්‍රමාණාත්මක නොවන තොරතුරු

## ප්‍රමාණාත්මක නොවන තොරතුරු (Non Quantitative Information)

යම් කිසි ව්‍යාපාරයකට අදාළව සංඛ්‍යාත්මකව හෝ මූල්‍යමය වශයෙන් ප්‍රකාශ කළ නොහැකි හුදෙක් සාමාන්‍ය විස්තරයක් පමණක් ඇතුළත් තොරතුරු, ප්‍රමාණාත්මක නොවන තොරතුරු ලෙස හැඳින්වේ.

උදා :- * ව්‍යාපාරයේ කළමනාකරු ඉතා දක්ෂ පුද්ගලයෙකි.
* ව්‍යාපාරයේ සේවකයන් අවංක පුද්ගලයන් වේ.
* ව්‍යාපාරයේ කටයුතු වලින් පරිසර දූෂණය අවම වේ.

සම්පත් දායකත්වය : බස්නාහිර පළාත, නැගෙනහිර පළාත
සැකසුම: ඒ.එම්.එස්.යු ගුණවර්ධන මිය, ශාන්ත ඇන්ඩ්‍රූ මහා විද්‍යාලය - පුත්තලම
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ප්‍රමාණාත්මක තොරතුරු (Quantitative Information)

යම් කිසි ව්‍යාපාරයකට අදාළව සංඛ්‍යාත්මකව හෝ මුල්‍යමය වශයෙන් ඉදිරිපත් කළ හැකි තොරතුරු ප්‍රමාණාත්මක තොරතුරු ලෙස හැඳින්වේ.

ප්‍රමාණාත්මක තොරතුරු ප්‍රධාන කොටස් දෙකකි.

01. මුල්‍යමය නොවන තොරතුරු
02. මුල්‍යමය තොරතුරු

## මූල්‍යමය නොවන තොරතුරු - (Non-Financial Information)

යම් කිසි ව්‍යාපාරයකට අදාළව මුල්‍යමය වශයෙන් ප්‍රකාශ කළ නොහැකි එහෙත් සංඛ්‍යාත්මකව ප්‍රකාශ කළ හැකි තොරතුරු මුල්‍යමය නොවන තොරතුරු ලෙස හැඳින්වේ.
මේවා ගිණුම්කරණ කටයුතු සඳහා යොදා නොගන්නා අතර තීරණ ගැනීම සඳහා වැදගත් වේ.

උදා :- ව්‍යාපාරයේ සේවක සංඛ්‍යාව 50 කි.
ව්‍යාපාරය නිපදවන භාණ්ඩ වර්ග ගණන 120 කි.

## මූල්‍යමය තොරතුරු (Financial Information)

යම් කිසි ව්‍යාපාරයකට අදාළව මුල්‍යමය වශයෙන් ඉදිරිපත් කළ හැකි ප්‍රමාණාත්මක තොරතුරු මුල්‍යමය තොරතුරු ලෙස හැඳින්වේ.

මෙම තොරතුරු ගිණුම්කරණ කටයුතු සඳහා යොදා ගනු ලැබේ. එම නිසා මෙම මුල්‍යමය තොරතුරු ගිණුම්කරණ තොරතුරු (**Accounting Information**) ලෙස හැඳින්වේ.

මේවා ප්‍රධාන කොටස් දෙකකි.

01. මුල්‍ය ගිණුම්කරණ තොරතුරු
02. කළමනාකරණ ගිණුම්කරණ තොරතුරු

** පිරිවැය ගිණුම්කරණ තොරතුරු කළමණාකාරණ ගිණුම්කරණ තොරතුරු තුළට අන්තර්ගත බැවින් එය වෙනම ම වර්ගීකරණය කිරීම වර්තමානයේ දී සිදු නොකරයි.

## මූල්‍ය ගිණුම්කරණ තොරතුරු (Financial Accounting Information)

මූල්‍ය ගිණුම්කරණය මඟින් වාර්ෂිකව පිළියෙල කරනු ලබන මූල්‍ය ගිණුම්කරණ වාර්තා වන ලාභාලාභ ප්‍රකාශනය ( වෙළඳ ගිණුම හා ලාභලාභ ගිණුම ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යනාදිය මගින් ඉදිරිපත් කරන මුල්‍යමය තොරතුරු මින් අදහස් වේ.

උදා : - විකුණුම් ආදායම රු 75 000 කි . ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු 10 000 කි. ව්‍යාපාරයේ ජංගම වත්කම් රු 50 000 කි.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## කළමනාකරණ ගිණුම්කරණ තොරතුරු (Management AccountingInformation

කළමනාකරණ ගිණුම්කරණය මඟින් ඉදිරිපත් කරන ව්‍යාපාර ආයතනයේ කළමනාකරුවන්හට කළමණාකරණ තීරණ ගැනීමට අවශ්‍ය වන මූල්‍යමය තොරතුරු කළමණාකරණ ගිණුම්කරණ තොරතුරු නම් වේ.

උදා :- ණය ස්කන්ධ අනුපාතය 2 : 1 කි. දළ ලාභ අනුපාතය 5 % කින් වර්ධනය වී ඇත.

### ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශ්වයන්

**1. ව්‍යාපාරයක අයිතිකරුවන්**

ව්‍යාපාරයට ප්‍රාග්ධනය යොදවා ඇති පාර්ශ්වය අයිතිකරුවන් ලෙස හැඳින්වේ.

**ඔවුන්ට ගිණුම්කරණ තොරතුරු අවශ්‍ය වන්නේ**

- යෙදූ ප්‍රාග්ධනයට කුමක් සිදු වී ඇද්ද යන්න දැන ගැනීමට.
- උපයා ඇති ලාභ ප්‍රමාණවත්ද යන්න දැන ගැනීමට.
- යොදවා ඇති අරමුදල් ආරක්ෂිතද යන්න දැන ගැනීමට.

**2. ව්‍යාපාරයක කළමනාකරුවන්**

ව්‍යාපාරයක පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නන් කළමනාකරුවන් ලෙස හැඳින්වේ.

**ඔවුන්ට ගිණුම්කරණ තොරතුරු අවශ්‍ය වන්නේ**

- අතීතයේදී ගනු ලබන තීරණ වල සාර්ථක අසාර්ථකභාවය දැන ගැනීමට.
- දෛනික ව්‍යාපාර කටයුතු වලදී තීරණ ගැනිමට.
- ඉදිරි අනාගත සැලසුම් සකස් කිරීමට.

**3. ව්‍යාපාරයක ණයහිමියන්**

ව්‍යාපාරයට ණය මුදල් සපයා ඇති පාර්ශ්වයන් ණයහිමියන් ලෙස හැඳින්වේ.

**ඔවුන්ට ගිණුම්කරණ තොරතුරු අවශ්‍ය වන්නේ**

- ව්‍යාපාරයට ලබා දී ඇති ණය මුදල්වල ආරක්ෂාව පිලිබඳ දැන ගැනීමට.
- ණය වාරික හා පොලිය අයකරගැනීමට හැකිද යන්න දැන ගැනීමට.
- තවදුරටත් ණය සැපයීමට සුදුසුද යන්න දැනගැනීමට.

**4. අනාගත ආයෝජකයින්**

ව්‍යාපාර ආයතනවල මුදල් ආයෝජනය කිරීමට බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයන් අනාගත ආයෝජකයින් ලෙස හැඳින්වේ.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**ඔවුන්ට ගිණුම්කරණ තොරතුරු අවශ්‍ය වන්නේ**

- ලාභ ලබන ව්‍යාපාර ආයතන මොනවාද යන්න දැන ගැනීමට
- තමන් යෙදවීමට අපේක්ෂිත මුදල්වල ආරක්ෂාකාරී බව දැන ගැනීමට.

5. **විවිධ රජයේ ආයතන**

විවිධ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය ආයතන විසින් ව්‍යාපාර ආයතනවලට අදාළ ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගනු ලැබේ.

- දේශීය අදායම් දෙපාර්තමේන්තුව ආදායම් බදු අයකර ගැනීමට.
- ශ්‍රී ලංකා මහා බැංකුව රටේ ආර්ථික තත්ත්වය විග්‍රහ කිරීමට.

6. **ව්‍යාපාරයක සේවකයින්**

ව්‍යාපාර ආයතනයේ ව්‍යාපාරික කටයුතු සිදුකරනු ලබන්නන් සේවකයින් ලෙස හැඳින්වේ.

**ඔවුන්ට ගිණුම්කරණ තොරතුරු අවශ්‍ය වන්නේ**

- රැකියාවේ අනාගත සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට.
- ප්‍රමාණවත් පරිදි වැටුපක් ව්‍යාපාරය විසින් ලබා දෙන්නේදැයි දැන ගැනීමට.

7. **ව්‍යාපාරයක ගනුදෙනුකරුවන්**

ව්‍යාපාරයෙන් භාණ්ඩ මිලදී ගන්නන් හා ව්‍යාපාරයට භාණ්ඩ විකුණන්නන් ගනුදෙනුකරුවන් ලෙස හැඳින්වේ.

**ඔවුන්ට ගිණුම්කරණ තොරතුරු අවශ්‍ය වන්නේ**

- තම ගනුදෙනු කරන ව්‍යාපාරයේ අනාගත ස්ථාවරත්වය දැන ගැනීමට.
- ව්‍යාපාරය සමග අඛණ්ඩව ගනුදෙනු කරගෙන යන්නේදැයි තීරණය කිරීමට.

8. **විවිධ වෘත්තීය කණ්ඩායම්**

බැංකු කරුවන් , රක්ෂකයින් , කොටස් වෙළඳ පොළේ සාමාජිකයින් , මාධ්‍යවේදීන් යන විවිධ වෘත්තීන් වලට අදාළ යම් යම් කටයුතු ඉටු කිරීම සඳහා විවිධ ව්‍යාපාරවල ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගනී.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ගිණුම්කරණයේ ප්‍රභේද

ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන් අනුව ගිණුම්කරණය ප්‍රධාන කොටස් දෙකකි.

ගිණුම්කරණය

- මූල්‍ය ගිණුම්කරණය
- කළමනාකරණ ගිණුම්කරණය

## මූල්‍ය ගිණුම්කරණය

ගිණුම්කරණ ඒකකයක අතීත ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ තොරතුරු ආර්ථිකමය තීරණ ගැනීමට සුදුසු වන ආකාරයට සකස් කර බාහිර පාර්ශවයන්ට ඉදිරිපත් කිරීම මූල්‍ය ගිණුම්කරණයයි.

## කළමනාකරණ ගිණුම්කරණය

ආයතනයක සියලුම කළමනාකරණ මට්ටම්වලට අවශ්‍ය වන පරිදි සැලසුම් කිරීම , පාලනය කිරීම , තීරණ ගැනීම , වගකීම් ඉටු කිරීමට හැකි වන සේ මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම කළමනාකරණ ගිණුම්කරණයයි.

## මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය

| ගිණුම්කරණයෙදවුම් | → | ගිණුම්කරණ ක්‍රියාවලිය | → | ගිණුම්කරණ නිමවුම් |
|---|---|---|---|---|
| ගනුදෙනු හා සිද්ධි | → | ↓ හඳුනාගැනීම හා මැනීම ↓ සටහන් කිරීම ↓ වර්ගකිරීම ↓ සාරාංශ කිරීම ↓ විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම | → | මූල්‍ය ප්‍රකාශන |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය**

| ගිණුම්කරණ යෙදවුම් | → | ගිණුම්කරණ ක්‍රියාවලිය | → | ගිණුම්කරණ නිමවුම් |
|---|---|---|---|---|
| ඓතිහාසික තොරතුරු<br>පුරෝකථන තොරතුරු | → | සැලසුම් කිරීම<br>↓<br>අයවැය සකස් කිරීම<br>↓<br>පාලනය කිරීම | → | අයවැය ලේඛන<br>ගිණුම්කරණ අනුපාත<br>ආන්තික පිරිවැය තොරතුරු<br>ආයෝජන තීරණ ඇගයීම් තොරතුරු |

## මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම්

| මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|
| 1. ඓතිහාසික තොරතුරු පමණක් යොදා ගනියි. | 1. ඓතිහාසික තොරතුරු මෙන්ම පුරෝකථන තොරතුරු යොදා ගනියි. |
| 2. බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ට තොරතුරු ඉදිරිපත් කරයි. | 2. අභ්‍යන්තර පාර්ශවයන්ට පමණක් තොරතුරු ඉදිරිපත් කරයි. |
| 3. ගිණුම්කරණ කාලච්ඡේදයක් සඳහා තොරතුරු ඉදිරිපත් කරයි. | 3. කළමනාකරණයට අවශ්‍ය අවස්ථාවන් හි තොරතුරු ඉදිරිපත් කරයි. |
| 4. ගිණුම්කරණ සංකල්ප , නීති රීති , සම්ප්‍රදායන් හා ගිණුම්කරණ ප්‍රමිත යොදා ගනියි. | 4. ගිණුම්කරණ සංකල්ප , නීති රීති , සම්ප්‍රදායන් හා ගිණුම්කරණ ප්‍රමිත අදාළ නොවේ. |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**<u>පුනරීක්ෂණ :</u>**

1. ගිණුම්කරණයේ අරමුණ කුමක් ද?
2. ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් 4 ක් නම් කරන්න.
3. පහත සඳහන් පාර්ශවයන් ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දැක්වීමට හේතුවක් බැගින් සඳහන් කරන්න.
   (අ) අයිතිකරු / අයිතිකරුවන්
   (ආ) බැංකු
4. ගිණුම්කරණයේ ප්‍රභේද නම් කරන්න.
5. මූල්‍ය ගිණුම්කරණය යනු කුමක් ද?
6. මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය නම් කරන්න.
7. කළමනාකරණ ගිණුම්කරණය යනු කුමක් ද?
8. කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය නම් කරන්න.
9. මූල්‍ය සිද්ධි හතරක් නම් කරන්න.
10. මූල්‍ය නොවන සිද්ධි දෙකක් ඉදිරිපත් කරන්න.
11. මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් දෙකක් ඉදිරිපත් කරන්න.

******************************


Copyright © www.e-thaksalawa.moe.gov.lk